# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/33 – 2017 දෙසැම්බර් 07 වැනි බ්‍රහස්පතින්දා – 2017.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2016/117.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

චන්න ප්‍රනාන්දු මයා ඇතුළු සේවකයින් 14 දෙනා, අංක 269/1, සිරිපුර, තලවතුගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, අංක 37, යෝර්ක් වීදිය, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30 හි සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/117.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වන්න ප්‍රනාන්දු මයා ඇතුළු සේවකයින් 14 දෙනා, අංක 269/1, සිරිපුර, තලවතුගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, අංක 37, යෝර්ක් වීදිය, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික** ආරාවුලට **හේතු** වී පවත්නා කරුණ වනුයේ,

''ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ අතිරික්ත සේවකයන් ඉවත් කිරීම සඳහා එකී බැංකුව විසින් හඳුන්වා දී ඇති, ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය (Voluntary Severance Scheme) යටතේ වන්දි ලබා 2015.12.31 වැනි දින සිට සේවය අවසන් කර ඇති වන්න ප්‍රනාන්දු මයා ඇතුළු පහත නම් සඳහන් සේවක පිරිසට, එම ස්වෙච්ඡා වන්දි යෝජනා ක්‍රමය නිසා අසාධාරණයක් සිදුව තිබේද යන්න සහ එසේ සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට වෙන වෙනම හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

01. වන්න ප්‍රනාන්දු
02. එස්. ජයතිලක
03. ඒ. අල්ලිරාජා
04. ලීලාන්ගනී ද සිල්වා
05. මනෝජ් අමරසිංහ
06. එම්. ගුණවර්ධන
07. හේමන්ත වික්‍රමරත්න
08. එන්. කෝන්ගාලගේ
09. බර්නිස් රෝච්
10. ඒ. ආර්. එම්. රෆී
11. සුසාන් ඒකනායක
12. තුල්ෂාරා දිසානායක
13. එස්. වයිමන්
14. අෂාන්ති ප්‍රනාන්දු

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

12 – 708

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.